# ක්‍රිස්තියානි බෞද්ධයෝ

ප්‍රවාදයක් (theory) යනු කුමක් දැ යි බටහිර සමාජයීය විද්‍යාඥයන්ට තේරුම්ගැනීමට නොහැකි වී ඇත. බටහිර සමාජයීය විද්‍යාවන් බටහිර භෞතික විද්‍යාව අනුගමනය කිරීමට සැරසෙන නමුදු ඔවුන්ට එය කරගැනීමට නොහැකි වී ඇත. බටහිර සමාජයීය විද්‍යාඥයෝ බටහිර භෞතික විද්‍යාව පසුපස නොන්ඩි ගසමින් යති. ලංකාවේ සමාජයීය විද්‍යාඥයන් යැයි කියන අයට අඩුම තරමින් එසේ නොන්ඩි ගැසීමටවත් නොහැකි ය. ඔවුන් ගැන කතා කිරීම වැඩකට ඇති දෙයක් නොවුණ ද, අද රටේ ඊනියා ප්‍රබුද්ධයන් බවට පත් වී ඇත්තේ මොවුන් නිසා ඔවුන් හෙළිදරවු කිරීමේ අවශ්‍යතාවය පැන නගී.

ප්‍රවාදයක් යනු තවත් කතන්දරයක් පමණකි. ප්‍රවාද ද මිනිසුන්ගේ නිර්මාණ වෙයි. බටහිර පශ්චාත්නූතනවාදී මතයකට අනුව දැනුම යනු සමාජයීය නිර්මාණයකි. ඉන් අදහස් වන්නේ ඒ ඒ සමාජය විසින්, එනම් ඒ ඒ සමාජයේ වාසය කරන මිනිසුන් විසින් දැනුම නිර්මාණය කෙරෙන බව ය. ප්‍රවාද ද දැනුමෙහි කොටසකි. එබැවින් ප්‍රවාද නිර්මාණය කෙරෙන්නේ ද මිනිසුන් අතිනි. ප්‍රවාද හා පළල් ව ගත්කළ දැනුම නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සිංහල බෞද්ධයන්ට ඇත්තේ බටහිර මතවාදය ඉක්මවා යන මතවාදයකි. දැනුම් නිර්මාණය පිළිබඳ සිංහල බෞද්ධ ප්‍රවාදයට අනුව, දැනුම මිනිසුන්ගේ ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂ වෙයි. බටහිරයන් සඳහන් කරන සමාජයීය නිර්මාණය යන්න දැනුම සංස්කෘතියට සාපේක්ෂ වේය යන අපේ ප්‍රවාදය තුළ ඇතැයි අපි සඳහන් කරමු. දැනුම නිර්මාණය කෙරෙන්නේ රික්තයක නොව සංස්කෘතියක ය.

දැනුම එලෙස ගත්කල සංස්කෘතියට සාපේක්ෂ වෙයි. එහෙත් දැනුම සාපේක්ෂ වන්නේ සංස්කෘතියට පමණක් නොවේ. එය මිනිසාගේ ඉන්ද්‍රිය පද්ධතියට හා මනසට ද සාපේක්ෂ වෙයි. බෞද්ධ සංස්කෘතිය තුළ මනස යනු තවත් ඉන්ද්‍රියක් පමණකි. එහෙත් බොහෝ දෙනාට තවමත් එසේ සිතීමට නොහැකි වී ඇත්තේ ඔවුන් ක්‍රිස්තියනි සංස්කෘතික පසුබිමක ජීවත්වන හා සිතන බැවින් ය. ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මනස යනු ඉන්ද්‍රියක් නොවේ. කෙසේ වෙතත් දැනුම මිනිසාගේ මනසට ද සාපේක්ෂ යැයි ගත්කල ඉන් කියැවෙන්නක් නම් මනසේ ස්වභාවය අනුව නිර්මාණය වන දැනුම ද වෙනස්වන බව ය. අනෙක් අතට මනස සංස්කෘතියෙන් ද යම් ප්‍රමාණයකට තීරණය වෙයි. එබැවින් දැනුම සංස්කෘතියට සාපේක්ෂ වෙයි. මනස ද ඉන්ද්‍රියයක් වුව ද මනසේ ක්‍රියා ක්‍රියාකාරිත්වය අනෙක් ඉන්ද්‍රියයන්ගෙන් වෙනස් වෙයි. මනස මතක තබා ගැනීමේ දී ඉවහල් වෙයි. අනෙක් ඉන්ද්‍රියයන් හා සම්බන්ධ දැනුම ලැබෙන්නේ මනස ද එකතු වීමෙනි. මනස නොමැති ව ඇසෙන් හෝ කණෙන් ලැබෙන සංඥා ගැන කිසිම දැනුමක්, හැඟීමක් අපට ඇති නොවේ.

දැනුම සංස්කෘතියට ද සාපේක්ෂ වේය යන්නෙන් දැනුම සංස්කෘතියට ඌනනය වන්නේ යැයි නොකියැවෙයි. අපේ දැනුමෙහි ඌනිතවාදයක් නැත. ඌනිතවාදය ඇත්තේ බටහිර දැනුමෙහි ය. එය කලින් වතාවල සඳහන් කර ඇති ආකාරයට බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි යෙහෝවා දෙවියන් වහන්සේ සමග බැඳී ඇත. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි එවැනි දෙවියන් වහන්සේ කෙනෙක් නැත. එහි ඌනිතවාදයක් ද නැත. දැනුම සංස්කෘතියට සාපේක්ෂවීම හා දැනුම සංස්කෘතියට ඌනනය වීම යනු එකක් නොව දෙකකි. දැනුම සංස්කෘතියට සාපේක්ෂ වීම යන්නෙහි අදහස තේරුම් ගැනීමට නොහැකි බොරු පණ්ඩිතයෝ දැන් වැඩකට නැති ප්‍රශ්නයක් අසති. සංස්කෘතිය යනු ද ප්‍රවාදයකි. ප්‍රවාද සියල්ල සංස්කෘතියට සාපේක්ෂ නම් හා ප්‍රවාද යනු යථාර්ථය නොවේ නම්, ප්‍රවාද යනු සම්මුති සත්‍ය පමණක් නම්, සංස්කෘතිය ද ප්‍රවාදයක් නිසා එය පමණක් සත්‍යය වීමට නොහැකි ය. මෙය ක්‍රිස්තියානි සංස්කෘතියක ඇති කරගත් මුග්ධභාවය නිසා අසන බොරු පණ්ඩිත ප්‍රශ්නයක් පමණකි.

පළමුවෙන් ම කිව යුත්තේ සංස්කෘතිය යනු ප්‍රවාදයක් නොවන බව ය. සංස්කෘතිය යනු සංකල්පයක් පමණකි. එහෙත් සංස්කෘතිය පිළිබඳ ප්‍රවාද ඇත. සංස්කෘතිය හා සංස්කෘතිය පිළිබඳ ප්‍රවාද අතර වෙනස තේරුම්ගත නොහැකි තැනැත්තා බොරු පණ්ඩිතයෙක් පමණකි. ප්‍රවාද යනු සම්මුති සත්‍ය පමණක් බන බැවින් සංස්කෘතිය පිළිබඳ ප්‍රවාද ද සම්මුති සත්‍ය විය යුතු ය යන්න මේ බොරු පණ්ඩිත ප්‍රශ්නයේ පදනමේ වෙයි. සංස්කෘතිය ද සම්මුති සත්‍යයක් නිසා මේ පණ්ඩිතරාළලා සංස්කෘතියට විශේෂ තැනක් දීම පිළිබඳ ව අසති. මේ මුග්ධකම මිස අනෙක් නොවේ. සංස්කෘතියට මෙහි කිසිම විශේෂ තැනක් දී නැත. මෙහි දී කියැවෙන්නේ දැනුම නිර්මාණය වන්නේ සංස්කෘතියට

© Prof. Nalin De Silva

සාපේක්ෂ බව පමණ ය. පැලයක් වැඩීමට පොහොර, ජලය ආදිය අවශ්‍ය වෙයි. එය ද පැළ වැඩීම සම්බන්ධයෙන් ඇති ප්‍රවාදයකි. මෙහි දී යම්කිසිවකුට කිව හැක්කේ පොහොරට හෝ ජලයට හෝ විශේෂ තැනක් දී ඇති බව ය. මෙහි එවැන්නක් සිදු නොවේ. පැලය වැඩීම සඳහා පොහොර අවශ්‍ය වන්නේ යැයි අප කියන්නේ සම්මුති සත්‍යයක් ලෙස ය. එය පැළ වැඩීම පිළිබඳ වෙනත් එවැනි ම සාපේක්ෂක සත්‍ය සමග සංගත වෙයි. මේ සංගත බව පමණක් මෙහි දී වැදගත් වෙයි.

දැනුම හා සංස්කෘතිය අතර ද ඇත්තේ එවැනි සම්බන්ධයකි. දැනුම සංස්කෘතියට සාපේක්ෂ ය යන්න ප්‍රවාදයකි. එය සාපේක්ෂ සත්‍යයකි. එය තවත් එවැනි ප්‍රවාද සමග සංගත වෙයි. දැනුම යනු මතවාදවල සංකල්පවල එකතුවකි. ඒ සියල්ල සම්මුති සත්‍ය වෙයි. ඒ සාපේක්ෂ සත්‍ය වන්නේ තවත් එවැනි මතවාද සමග සංගත වන බැවිනි. මෙය තේරුම් ගත හැක්කේ චක්‍රීය ව මිස ඒක රේඛීය ව නොවේ. අපේ ප්‍රවාද ගොඩ නැගෙන්නේ චක්‍රිය චින්තනයක් තුළ ය. මෙහි සඳහන් බොරු පණ්ඩිත ප්‍රශ්නයට යම් වලංගුභාවයක් ලැබෙන්නේ ඒක රේඛීය චින්තනයක් තුළ ය. යම් කිසි ආකාරයකින් අප ඒක රේඛීය චින්තනයක් තුළ දැනුම ගොඩ නගන්නේ නම් එවිට මෙවැන්නක් කිව යුතු වෙයි. දැනුම යනු ප්‍රවාදවල හා සංකල්පවල එකතුවක් බැවින් හා ප්‍රවාද ගොඩ නැගෙන්නේ සංස්කෘතියට සාපේක්ෂව බැවින් ප්‍රවාද යනු සම්මුති සත්‍ය වෙයි. එහෙත් සංස්කෘතිය  සාපේක්ෂ සත්‍යයක් නොවේ. අප එසේ කියා ඇත්නම් සංස්කෘතියට විශේෂ තැනක් දෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට යම් වලංගුභාවයක් වෙයි. දෙවියන් වහන්සේ ලෝකය මැවී ය. එහෙත් දෙවියන් වහන්සේ මැවූ කෙනෙක් නැත. දෙවියන් වහන්සේට එහි දී අනෙක් කිසිවකට නැති විශේෂ තැනක් හිමිවෙයි.

එහෙත් දෙවියන් වහන්සේ ද උන්වහන්සේ විසින් මවනු ලැබ ඇති දේවලින් ම මවනු ලැබෙන්නේ යැයි කිව හොත් එවිට අර ප්‍රශ්නය නැතිවෙයි. එහෙත් මෙහි දී ලෝක නිර්මාණය සම්බන්ධයෙන් කිව හැක්කේ දෙවියන් වහන්සේ ලෝකය මැවී ය හා ඒ මවනු ලැබූ දේ අතරින් දෙවියන් වහන්සේ මවනු ලැබිණිය යන්න ය. මෙහි විසංවාදයක් පරස්පරයක් වෙයි. මේ විසංවාදය ලැබෙන්නේ ඒක රේඛීය චින්තනය තුළ ය. ඒක රේඛිය චින්තනය තුළ යම් සංකල්පයකින් පටන්ගත යුතු ව ඇත. එසේ පටන් ගැනීමේ දී යොදා ගත් සංකල්පය, ඒ සංකල්පය පදනම් කරගෙන, ගොඩනගන අනෙක් සංකල්ප හා ප්‍රවාද ඇසුරෙන් තේරුම් කර දිය හැකි නොවේ.

එහෙත් චක්‍රීය චින්තනයක එවැන්නක් සිදු නොවෙයි. දැනුම නිර්මාණය වන්නේ සංස්කෘතියකට ද පදනම් වෙමිනි. එසේ නිර්මාණය වන දැනුම මගින් සංස්කෘතිය ද වෙනස් කෙරෙයි. මෙහි දී සංස්කෘතියට විශේෂ තැනක් කිසිම තැනක නොලැබෙයි. තවත් පැත්තකින් ගතහොත් ප්‍රවාද බිහිවන්නේ සංස්කෘතියක ය. සංස්කෘතිය පිළිබඳ ව ද ප්‍රවාදයක් වෙයි. මෙලෙස සලකා බැලූ කල ද සංස්කෘතියට විශේෂ තැනක් හිමි වී ඇතැයි  කිව නොහැකි ය. අර ප්‍රශ්න අසන බොරු පණ්ඩිතයා ඒ බව නොදනියි. ඔහු කරන්නේ අපේ කිනම් හෝ සංකල්පයක් ඒක රේඛීය චින්තනය තුළට ගැනීම ය. එසේ කිරීමේ දී ඔහු ඇතැම් දත්ත කපා දමයි. මෙහි දී ඔහු කපා දමන ගුණය වනුයේ සංස්කෘතියට ප්‍රවාද තිබිය නොහැකි බව ය. ඔහු ඒ බව උපකල්පනය කරයි. එසේ උපකල්පනය නොකළහොත් යම් තැනකින් නිර්මාණය පටන් ගන්නා බව කීමට නොහැකි වෙයි. එසේ උපකල්පනය කිරීමෙන් පසු ඔහු තොර තෝංචියක් නැති ව සංස්කෘතියට විශේෂ තැනක් දුන්නේ කෙසේ දැයි අසයි. එහෙත් මේ බොරු පණ්ඩිත කතාවට පදනම් වූ සංස්කෘතියට ප්‍රවාද නැත යන්න ඔහුගේ නිර්මාණයක් පමණකි. ඔහු ඒ බව අමතක කර සංස්කෘතියට විශේෂ තැනක් දීම පිළිබඳ ප්‍රශ්නය අසයි.

සංස්කෘතිය හා දැනුම අතර ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. දැනුම නිර්මාණය කෙරෙන්නේ යම් සංස්කෘතියක ය. එසේ නිර්මාණය කෙරුණු දැනුම ඒ සංස්කෘතියට සාපේක්ෂ වෙයි. සංස්කෘතියක් තුළ යම් දැනුමක් නිර්මාණය වූ පසු ඒ දැනුම විසින් සංස්කෘතිය ද ඉතා සුළු වශයෙන් හෝ වෙනස් වෙයි. එහෙත් මේ වෙනස බොහෝ අවස්ථාවල නොගිණිය හැකි ප්‍රමාණයේ අත්‍යුණකයකි (ඉතා සුළු වූවකි.) ඇතැම් අවස්ථාවල ඉන් යම් දැනෙන වෙනසක් සිදු වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් තාප ගතිකය පිළිබඳ දැනුම ගනිමු. බටහිර සංස්කෘතිය තුළ වාෂ්ප යන්ත්‍රය ද ඇතුළු තාප ගතිකය පිළිබඳ දැනුම නිර්මාණය කෙරිණි. ඒ දැනුම සමග බටහිර සංස්කෘතිය ද වෙනසකට භාජනය විණි. දුම්රිය ගමනාගමනය ඇති වූයේ වාෂ්ප යන්ත්‍රය නිෂ්පාදනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය. දුම්රිය හේතුවෙන් බටහිර සංස්කෘතිය ඉතා විශාල වශයෙන් වෙනස් විය. අද ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ දැනුමත් සමග බටහිර සංස්කෘතිය තවත් විශාල වෙනසකට භාජනය වී ඇත. පරිගණක, තොරතුරු තාක්ෂණය, ඒ හරහා මාධ්‍ය හැසිරවීම ආදිය

© Prof. Nalin De Silva

හේතුවෙන් බටහිර ලෝකය වෙනස් කෙරී ඇති අතර බටහිරයන් ඒ දැනුම උපයෝගී කරගනිමින් සෙසු ලෝකයා කෙරෙහි තම ආධිපත්‍යය තව තවත් පතුරුවන බව ද පෙනී යයි. ඒ හේතුවෙන් බටහිර නොවන ලෝකයෙහි ද සංස්කෘතිය ඉතා ශීඝ්‍රයෙන් වෙනස් වෙයි. මෙරට සිටින බොරු පණ්ඩිත ඇංකරයන්ට සංස්කෘතිය හා දැනුම අතර ඇති මේ චක්‍රීය සම්බන්ධය තේරුම් ගත නොහැකි ය. එයට හේතුව බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය හා ඒ සම්බන්ධ දැනුම විසින් ඔවුන්ගේ මනස් කුරුවළු කෙරී තිබීම ය. කුරුවළු වූ මනස් ඇති මොවුහු ඒක රේඛීය ව සිතති. එසේ ඒක රේඛීය ව සිතීම හේතුවෙන් ඔවුහු සෑම තැන ම මුලක්, විශේෂ හේතුවක්, එනම් දෙවියන් වහන්සේ කෙනකු දකිති.

ඇතැම් විට නමින් බෞද්ධයන් වුව ද මොවුහු සිතුම් පැතුම්වලින් ක්‍රිස්තියානිහු වෙති. බටහිර අධ්‍යාපනය මිනිසුන් වෙනස් කරන්නේ එපරිද්දෙනි. මෙරට බොහෝ උගත් බෞද්ධයෝ තමන් සිතුම් පැතුම්වලින් ක්‍රිස්තියානින් බව නොදනිති. ඇතැම්හු තමන් බෞද්ධයන් නොවන බව ද තමන්ට ආගමක් නොමැති බව ද පවසති. එහෙත් මේ ආගමක් නොමැති යැයි කියන්නෝ ද අවසාන විග්‍රහයේ දී සිතුම් පැතුම්වලින් ක්‍රිස්තියානිහු වෙති. මෙහි දී ක්‍රිස්තියානි යන්නෙන් කියැවෙන්නේ ඔවුන් ක්‍රිස්තියානි සංස්කෘතියකට අයත් බව පමණකි. ඔවුහු දෙවියන් වහන්සේ නොඅදහති. පල්ලි නොයති. එහෙත් ඒ ඒ දැනුම් පද්ධතිවල මුල හේතු සොයති. එනම් ඒ ඒ දැනුම් පද්ධතියෙහි දෙවියන් වහන්සේ සොයති. ඔවුහු අප විසින් නිර්මාණය කෙරෙන දැනුම් පද්ධතියෙහි ද දෙවි කෙනකු සොයති. අපේ දැනුම් පද්ධතියෙහි ඔවුන් දකින දෙවියන් වහන්සේ සංස්කෘතිය ය. එසේ සංස්කෘතිය දෙවියන් වහන්සේ ලෙස ගෙන ඔවුහු සංස්කෘතියට විශේෂ තැනක් දෙන්නේ ඇයි දැයි ප්‍රශ්න කරති. අපේ දැනුම් පද්ධතියෙහි දෙවියන් වහන්සේ කෙනෙක් නැත. සංස්කෘතියට විශේෂ තැනක් ඇත්තේ ද නැත. බටහිර යටත්විජිතවාදය ගැන කතා කරන විට පවා අපි එහි සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික සංරචක දකින්නෙමු. ඒ සංරචක අතර ඇති සම්බන්ධය ගැන ද කතා කරන්නෙමු. අපි කිසි විටෙකත් බටහිර යටත්විජිතවාදය සංස්කෘතියට ඌනනය නොකරමු. අපේ දැනුම් පද්ධතියෙහි ඌනිතවාදයක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva